# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 සැප්තැම්බර් මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.10.02 දින නිකුත් කරන ලදී)

# ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) සියයට දහයක ප්‍රතිශතයක් වන දළ එකතුව 2023 අප්‍රේල් මස 1 වන දින සිට 2025 ඔක්තෝබර් මස 1 වන දින දක්වා වන කාලසීමාව සඳහා පමණක් අදාළ වන පරිදි සීමා කිරීම;

(ආ) 2025 ඔක්තෝබර් මස 1 වන දින සිට බුකිකරුවකුගේ ව්‍යාපාරයක් හෝ සූදු ව්‍යාපාරයක් සිදු කරගෙන යන තැනැත්තන්ගෙන් අයකරනු ලබන දළ එකතුව මත බද්ද සියයට දහඅට දක්වා ඉහළ දැමීම; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන තැනැත්තන්ගෙන් අයකරනු ලබන කැසිනෝ ඇතුළුවීමේ බද්ද එක්සත් ජනපද ඩොලර් සියය දක්වා ඉහළ දැමීම වේ.

එල්.ඩී. - ඕ 13/2025

## 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක        දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2023 අංක 11 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ -

(අ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "සියයට දහයක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන වෙනුවට "සියයට දහයක අනුපාතයකට අනුව වූ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ඇ) වන ඡේදයේ "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2025 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් අවසන් වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

PL 15443 - 465 (2025/09)

(ඇ) එම වගන්තියේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2025 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහඅටක අනුපාතයකට අනුව වූ.";

(2) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "එක්සත් ජනපද ඩොලර් පනහක්" යන වචන වෙනුවට "එක්සත් ජනපද ඩොලර් සියයක්" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව